සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
Ministry of Social Empowerment & Welfare
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
National Secretariat for Elders

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | NSE/DEV/01/02 – IV (2) | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017. 05 . 08 |

දිස්ත්‍රික් ලේකම්,

ප්‍රාදේශීය ලේකම්,

පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

# " දෙටුවර අභිමන් "

## 2017 - ජාත්‍යන්තර වැඩිහිටි දින සමරු උළෙල

## දැනුම මිනුම දීප ව්‍යාප්ත තරඟාවලිය

හැඳින්වීම

මෙලොව උපත ලබන දරුවා සමාජානුයෝජනය මුල් වරට ලබා ගන්නේ මවගෙනි. මුල්වරට කිරි උගුර උරා බීමේ සිට ඇසෙන හඬවල් ගැන අවධානය යොමුකර සිය මව හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ඊට අයත් වේ. මනෝවිද්‍යාඥයින් පවසන ආකාරයට මූලික ඉගෙනුම් ක්‍රියාවලියේ ආරම්භය මෙය වේ. මෙම ආරම්භක ඉගෙනුම් ක්‍රියාවලිය අවසානයේ පුද්ගලයා රටට වැඩදායී පුද්ගලයකු බවට පත්වේ. මෙසේ වන්නේ දෙමාපියන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම පූර්වාචාරීන් වීමය.

නාගරීකරණය, බටහිරකරණය, කාර්මීකරණයට ලක් වූ නූතන සමාජ තුළ යුතුකම් හා වගකීම් අමතක වී යන බව දක්නට ලැබේ. අපි හැමදාමත් වැඩිහිටියන්ට සලකන ජාතියක් ලෙස ලෝකය ඉදිරියේ ප්‍රශංසාභිමුඛව පෙනී සිටියෙමු. ශ්‍රී ලංකා සමාජයේ අතීතය යනු අනාගතයේ කැඩපතකි. සුරක්ෂිත හෙට දිනක් උදෙසා සූදානම් වීමට නම් අතීතයේ සිටි පූර්වාචාරීන් වන අපගේ දෙමාපියන් අමතක කළ නොහැක.

"අප හැදුණේ ගොන් කිරි බීලා නෙවේ, මව් කිරි බීලා" කටවහරේ එන මෙවන් ප්‍රකාශවල කියවෙන්නේද නිරෝගී සම්පත වේ. ගුණවත්තකම මිනිසාට හිමිවූයේ මව්කිරිවල ඇති ගුණය නිසාය. මේ පිළිබඳව සිඟාලෝවාද සූත්‍රයේද සඳහන් වේ. ජාතියේ අවාසනාවට මෙම දේශනා පිළිබඳ අවබෝධයක් අද තරුණ දූ පුතුන්ට නොමැත. ගමයි- පන්සලයි- වැවයි- දාගැබයි යන සංකල්පයෙන් ඉවත් වී නාගරීකරණය, බටහිරකරණය, කාර්මීකරණයන්හි ක්‍රමික විකාශනයක් සමග සමාජය සංකර වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මාපිය දූ දරු සබඳතා බිඳී ගොස් මුදල් පසුපස හඹායන සමාජයක් නිර්මාණය වන්නේ ගතවන හැම තත්පරයක්ම මුදල් බවට පරිවර්තනය කිරීමේ අරමුණිනි.

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2 மாடி, D பிரிவு, செத்சிறிபாய 2வது கட்டிடத் தொகுதி,பத்தரமுல்லை
Address : 2nd Floor, Block D, Sethsiripaya - II Stage, Baththaramulla
ඊ-මේල් / ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office : 0113094543/44
ෆැක්ස් / பெக்ஸ் / Fax : 0112187015

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 14% ක ප්‍රතිශතයක් වයස අවුරුදු 60 වැඩි අතර වර්ෂ 2020 වන විට මෙම ප්‍රතිශතය 22 % ක් පමණ වනු ඇති බවට ඇස්තමේන්තු ගත කොට තිබේ. ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගෙන් 80% කට වඩා ප්‍රතිශතයක් රටේ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව ජීවත්වන අතර, ඉතිරි කොටස නගර ආශ්‍රිතව ජීවත් වේ. මෙවැනි පසුබිමක් තුළ වැඩිහිටියන්ගේ වටිනාකම් පිළිබඳ අවබෝධයක් දැයේ දූ දරුවන්ට ලබාදීම සහ වියැකී යන දූ දරු මව්පිය සම්බන්ධතා වර්ධනය කිරීම ඉතා කාලෝචිත වේ.

ශ්‍රී ලාංකේය වංශ කථාව ඉතා රසවත් සේම වින්දනීය හා ගරු කොට යුතු එකක් බවට අප විශ්වාස කරමු. මෙකී වංශ කථාව තුල අප නොදත් එහෙත් අපේ මව්පියවරුන්, මුතුන් මිත්තන් දත් දෑ බොහෝමයක් වෙයි. එමෙන්ම වර්තමාන සමාජයේ නවීන හා තාක්ෂණික දැනුම අතිමහත්ය. මෙම දැනුම වර්තමාන දරුපරපුර කෙසේ ග්‍රහණය කරගෙන ඇත්ද, ඒ තුළ ඔවුන්ගේ අනාගත දැක්ම කෙබඳුද යන්න උරගා බැලීම උදෙසා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව සමෘද්ධි කැකුළු සමාජ ආශ්‍රයෙන් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික තලය දක්වා දීප ව්‍යාප්ත වූ දැනුම මිනුම තරඟාවලියක් 2017 ජාත්‍යන්තර වැඩිහිටි උත්සවය පදනම් කර ගනිමින් පැවැත්වීමට අදහස් කර ඇත.

## ක්‍රමවේදය

මෙම තරඟාවලිය දීපව්‍යාප්තව පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. එහිදී ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් සියළුම කැකුළු සමාජ නියෝජනය කරමින් වයස අවුරුදු 15 - 18 අතර වයස් මට්ටමේ තරඟකරුවන්ට ඉදිරිපත් වීමේ හැකියාව පවතී. එහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියළුම කැකුළු සමාජ අතරින්, සුදුසුම කැකුළු සාමාජිකයන් 05 දෙනෙකු හා අතිරේක 02 නෙකුගෙන් යුත් එක් කණ්ඩායමක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය නියෝජනය කරමින් මෙම තරඟාවලියේ මූලික වටය හෙවත් දිස්ත්‍රික් මට්ටමේ තරඟාවලියට සහභාගී වනු ඇත. එකී තරඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් මෙහෙයවන අතර දිස්ත්‍රික් මට්ටමේ තරඟාවලියෙන් පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබා ජයග්‍රහණය කරනු ලබන කණ්ඩායම් 75 දෙවන වටය සඳහා සුදුසුකම් ලබනු ඇත. දෙවන වටයේ තරඟ පළාත් මට්ටමින් පවත්වනු ලබන අතර, සෑම පළාතකින්ම පළමු ස්ථානය ලබන කණ්ඩායම් අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලබනු ඇත. සමස්ථ වැඩසටහන සංවිධානය කිරීමේදී ප්‍රාදේශීය මට්ටමින් ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය යටතේ ද, දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ලේකම්ගේ හා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ ද සිදු කළ යුතුය. අවසන් මහා තරඟය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම අවසන් වටයේ තරඟාවලියෙන් ජයගන්නා කණ්ඩායම ඔක්තොබර් 01 දින පැවැත්වෙන ජාත්‍යන්තර වැඩිහිටි දින සමරු උලලේ දී ගෞරව බහුමානයෙන් යුක්තව පිදුම් ලබනු ඇත.

## පොදු උපදෙස්

01. එක් කණ්ඩායමක්, කණ්ඩායම් නායක උප නායක ඇතුළුව දරු/දැරියන් දෙපක්ෂයම නියෝජනය වන පරිදි තරඟකරුවන් 05 ක් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. ඊට අමතරව අතිරේක තරඟකරුවන් දෙදෙනෙකු ද (02) ඇතුලත් විය යුතුය. තරඟ වදින කණ්ඩායම පිරිමි සහ ගැහැණු දරුවන් යන දෙපක්ෂයෙන්ම සමන්විත විය යුතුය.

02. කණ්ඩායම සඳහා තරඟකරුවන් තෝරා ගැනීම සහ සියලු සංවිධාන කටයුතු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මහා සංගම් අධ්‍යක්ෂ /මුලස්ථාන කළමනාකරු සහ සමාජ සේවා නිලධාරී/වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර/සමාජ සංවර්ධන සහකාර /සංවර්ධන නිලධාරී යන, නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

03. එක් විනිසුරු මඬුල්ලක් තුන්දෙනෙකුගෙන් සමන්විත විය යුතුවන අතර විෂය සම්බන්ධයෙන් විශේෂ නිපුනත්වයක් ඇති අයගෙන් තෝරාපත් කර ගත යුතුයි. දමිළ භාෂාව නියෝජනය කරන තරඟකරුවන් වේනම්, විනිසුරු මඬුල්ල සඳහා දමිළ භාෂාව නියෝජනය කරන විනිසුරුවරයකුද සිටිය යුතුය.

04. මූලික තරඟාවලිය සඳහා ඉදිරිපත්වන කණ්ඩායම් සාමාජිකයන්ම අවසන් මහා තරඟය දක්වාම තරඟ කළ යුතු අතර සාමාජිකයන් (සාමාජිකයන් 07) වෙනස් නොවිය යුතුය.

05. මූලික වටයේ තරඟ දිස්ත්‍රික් මට්ටමින් ද, දෙවන වටයේ තරඟ පළාත් මට්ටමින් සහ අවසාන ජාතික මහා තරඟය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව පවත්වනු ලැබේ.

06. ප්‍රාදේශීය මට්ටමින් සුදුසුකම් ලබා දිස්ත්‍රික් මට්ටමට යන කණ්ඩායමෙහි අනන්‍යතාවය පිළිබඳ සහතික වීමක් ප්‍රාදේශීය ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දිය යුතුය.

07. දිස්ත්‍රික් මට්ටමින් සුදුසුකම් ලබා පළාත් මට්ටමට යන කණ්ඩායමෙහි අනන්‍යතාවය පිළිබඳ සහතික වීමක් දිස්ත්‍රික් ලේකම් විසින් පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය.

08. ජාතික මට්ටම සඳහා පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් අනන්‍යතාවය තහවුරු කර එවන කණ්ඩායම පමණක් (සාමාජිකයින් 07) අවසාන ජාතික තරඟය සඳහා ඉදිරිපත් විය හැක.

## තරඟ රීති

01. සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ආගමික, නෛතික, අධ්‍යාපනික, ඓතිහාසික, සෞඛ්‍යය, වෛද්‍ය විද්‍යාව, තාක්ෂණය, පරිසරය වැනි ක්ෂේත්‍ර ඇසුරින් දේශීය හා විදේශීය තොරතුරු පාදක කර ගනිමින් ප්‍රශ්න ඉදිරිපත් කරනු ලැබේ.

02. කණ්ඩායම්වලට යොමු කරන ප්‍රශ්න සකස් කිරීමේ කාර්යය දිස්ත්‍රික් ලේකම්ගේ/පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකගේ /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ උපදෙස් හා මඟ පෙන්වීමට යටත්ව සිදු විය යුතු අතර තරඟය පැවැත්වෙන අවස්ථාව වන තෙක් එම ප්‍රශ්න කට්ටලවල රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතු වේ.

03. සියලුම ප්‍රශ්න පැහැදිලි, නිරවුල් පිළිතුරු ලබා දිය හැකි ප්‍රශ්න වලින් සමන්විත විය යුතුය.

04. තරඟය වට තුනකින් සමන්විත වන අතර පළමු වටය පිළිතුරු 04 කින් යුක්ත බහුවරණ ප්‍රශ්න වලින් ද, දෙවන වටය ඍජු පිළිතුරු සැපයිය හැකි කෙටි ප්‍රශ්න වලින් ද, තෙවන වටය රූපමය ප්‍රශ්න වලින් ද සමන්විත විය යුතු අතර එක් වටයකදී එක් තරඟකරුවෙකුට ප්‍රශ්න 01 බැගින් ප්‍රශ්න 03 ක් යොමුවන අතර තරඟාවලිය තුළ එක් කණ්ඩායමකට ප්‍රශ්න 15 (පහළොවක්) යොමු වේ.

*බහුවර්ණ ප්‍රශ්න වටය තුළ,*

- එක් තරඟකරුවෙකුට තම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට තත්පර 20 ක කාලයක් ලබා දෙන අතර ඒ සඳහා අදාල කාලය තුළදී එක් උත්සහායකදී පිළිතුරු ලබා දිය යුතුය.
- අදාල තරඟකරු නියමිත කාලය තුළදී නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වුවහොත් එම පිළට ඒ සඳහා නැවත අවස්ථාවක් හිමි නොවන අතර, ප්‍රතිවාදී පිළට එම අවස්ථාව යොමු වේ. මේ සඳහා තත්පර 10 ක කාලයක් තුළ එක් උත්සාහයකදී පිළිතුරු ලබා දිය යුතුය.

*කෙටි ප්‍රශ්න වටය තුළ,*

- එක් තරඟකරුවෙකුට තම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට තත්පර 20 ක කාලයක් ලබා දෙන අතර ඒ සඳහා අදාල කාලය තුළ දෙවරක් උත්සහා කළ හැකිය.
- අදාල තරඟකරු නියමිත කාලය තුළදී නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වුවහොත් එම පිළේම වෙනත් සාමාජිකයෙකුට අවස්ථාව හිමි වන අතර, ඒ සඳහා තත්පර 10 ක කාලයක් තුළ එක් උත්සාහයකදී පිළිතුරු ලබා දිය යුතුය.
- එම සාමාජිකයාත් එකී ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අපොහොසත් වන්නේ නම් ප්‍රතිවාදී පිළට එම ප්‍රශ්නය යොමු කළ යුතුය. මේ සඳහා තත්පර 10 ක කාලයක් තුළ එක් උත්සාහයකදී පිළිතුරු ලබා දිය යුතුය.

*රූපමය ප්‍රශ්න වටය තුළ,*

- එක් තරඟකරුවෙකුට තිරයේ දිස්වන ඡායාරූපයක් පදනම් කරගෙන ප්‍රශ්නය යොමුවන අතර, ඒ සඳහා තත්පර 20 ක කාලයක් තුළ එක් අවස්ථාවකදි පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- අදාල තරඟකරු නියමිත කාලය තුළදී නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වුවහොත් එම පිළට ඒ සඳහා නැවත අවස්ථාවක් හිමි නොවන අතර, ප්‍රතිවාදී පිළට එම අවස්ථාව යොමු වේ. මේ සඳහා තත්පර 10 ක කාලයක් තුළ එක් උත්සාහයකදී පිළිතුරු ලබා දිය යුතුය.

05. සෑම තරඟ වටයකදීම ප්‍රශ්නය යොමුවන තරඟකරුගේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 10 ක්ද, එම පිළේම වෙනත් සාමාජිකයෙකු පිළිතුරු සැපයූ විට ලකුණු 05 ක් ලෙස සහ ප්‍රතිවාදී පිළ පිළිතුරු සැපයූ විට ලකුණු 05 ක් ලෙසද ලකුණු ලබා දිය යුතුය..

06. කිසිම තරඟ වටයකදී කණ්ඩායම එකතු වී සාකච්ඡා කර පිළිතුරු ලබා දිය නොහැකිය.

07. තරඟ කොන්දේසි කඩකරන කණ්ඩායම් දැනුම් දීමකින් තොරව තරඟාවලියෙන් ඉවත් කෙරේ.

08. මුළු තරඟාවලියම අපක්ෂපාතී සාධාරණ හා විනිවිදභාවයෙන් යුතුව පැවැත්විය යුතු අතර විනිසුරු මඬුල්ලේ තීරණය අවසන් තීරණයය වේ. කණ්ඩායම් දෙකක් සම ලකුණු ලබා ගත්තේ නම් අවස්ථාවෝචිත ක්‍රියා මාර්ගයක් තුළින් ජයග්‍රාහී කණ්ඩායම තෝරා ගැනීම විනිසුරු මඬුල්ල සතු වේ.

09. සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තරඟය සඳහා යොමු කරන සාමාජිකයන් පිළිබඳ තොරතුරු ඇමුණුම 01 - A හි ආකෘති පත්‍රය මගින් සම්පූර්ණ කර 2017.06.15 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දිය යුතු අතර එදිනට පසු ලැබෙන සාමාජික නාමලේඛණ තරඟාවලියෙන් ඉවත් කළ යුතුය.

10. සියළුම දිස්ත්‍රික් තරඟ 2017.07.15 දින වන විට අවසන් කර දිස්ත්‍රික්කයේ ජයග්‍රාහී කණ්ඩායමේ තොරතුරු ඇමුණුම 01 - B හි ආකෘති පත්‍රය මගින් සම්පූර්ණ කර 2017.07.25 දිනට පෙර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. කණ්ඩායම් දෙකක් හෝ කීපයක් සම ලකුණු ලබා ගත්තේ නම් අවස්ථාවෝචිත ක්‍රියා මාර්ගයක් තුළින් ජයග්‍රාහී කණ්ඩායම තෝරා ගැනීම විනිසුරු මඬුල්ල සතු වේ.

11. සියළුම පළාත් තරඟ 2017.08.25 දින වන විට අවසන් කර පළාත් ජයග්‍රාහී කණ්ඩායමේ තොරතුරු ඇමුණුම 01 - C හි ආකෘති පත්‍රය මගින් සම්පූර්ණ කර අදාල තරඟ සංවිධානය කළ නිලධාරීන්ගේ නිර්දේශය හා පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව 2017.08.28 දිනට පෙර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. කණ්ඩායම් දෙකක් සම ලකුණු ලබා ගත්තේ නම් අවස්ථාවෝචිත ක්‍රියා මාර්ගයක් තුළින් ජයග්‍රාහී කණ්ඩායම තෝරා ගැනීම විනිසුරු මඬුල්ල සතු වේ.

12. 2017 සැප්තැම්බර් මස තුන්වන සතිය තුළ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවසන් මහා ජාතික තරඟය පවත්වනු ලැබේ.

13. මුළු තරඟාවලියම අපක්ෂපාතී සාධාරණ හා විනිවිදභාවයෙන් යුතුව පැවැත්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.

14. සමස්ථ වැඩසටහන සම්බන්ධ අධීක්ෂණය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලැබේ.

මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

| | |
|---|---|
| සුචින්ද එස්. සිංගප්පුලි | නීල් බණ්ඩාර හපුහින්න |
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ ජනරාල් |
| ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |

පිටපත් :- සමාජ සේවා නිලධාරී / වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර/ සමාජ සංවර්ධන සහකාර /සංවර්ධන නිලධාරී /සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මහා සංගම් අධ්‍යක්ෂ / මූලස්ථාන කළමනාකරු — කා.දැ.ස. සහ අ.ක.ස.

# "දෙටුවර අභිමන්"

## ජාත්‍යන්තර වැඩිහිටි දින සමරු උළෙල - 2017

## දැනුම මිනුම දීප ව්‍යාප්ත තරඟාවලිය

## තරඟයට සාමාජිකයින් ඇතුලත්වීමේ විස්තර ලේඛනය

1. දිස්ත්‍රික්කය :-..............................................................................................
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..............................................................................................
3. කැකුළු සමාජයේ නම :-..............................................................................................

කණ්ඩායමේ තොරතුරු (කණ්ඩායම් නායකගේ නම පළමුව සඳහන් කරන්න)

| අනු අංකය | නම | දුරකථන අංකය | ජාතික හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |

ඉහත සඳහන් කරුණු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් තරඟයේ නීති රීතිවලට එකඟ වන බවත් ගරු විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගන්නා බවත් සහතික කර ප්‍රකාශ කරමි.

.........................................

කණ්ඩායම් නායක

දිස්ත්‍රික් ලේකම්,

ඉහත නම් සඳහන් අය කැකුළු සමාජ නියෝජනය කරන වයස අවුරුදු 15 - 18 දරු දැරියන් බව අනුමත කර ඉදිරිපත් කරමි.

.........................................................

දිනය

.........................................................

ප්‍රාදේශීය ලේකම්

# "දෙටුවර අභිමන්"

## ජාත්‍යන්තර වැඩිහිටි දින සමරු උළෙල - 2017

## දැනුම මිනුම දීප ව්‍යාප්ත තරඟාවලිය

1. දිස්ත්‍රික්කය :-.......................................................................................

2. ජයග්‍රාහී කණ්ඩායම අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ..........................................................

3. ජයග්‍රාහී කණ්ඩායම් සාමාජිකයන්ගේ නම් (කණ්ඩායම් නායකයාගේ නම අංක 01ට සඳහන් කරන්න)

| අංකය | නම | දුරකථන අංකය | හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |

පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,

2017 දෙටුවර අභිමන් දැනුම මිනුම තරඟාවලියෙන් ............................................... පළාතෙන් ලකුණු ............. ලබාගෙන .......................................... දිස්ත්‍රික්කයේ ......................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැකුළු සමාජ කණ්ඩායම දිස්ත්‍රික් තරඟාවලියෙන් පළමු ස්ථානය ලබාගෙන ජයග්‍රහණය කොට දෙවන වටයට තේරී ඇති බව අනුමත කරමි.

........................................ ........................................................

දිනය දිස්ත්‍රික් ලේකම්

# "දෙටුවර අභිමන්"

## ජාත්‍යන්තර වැඩිහිටි දින සමරු උළෙල - 2017

## දැනුම මිනුම දීප ව්‍යාප්ත තරඟාවලිය

1. පළාත :-.....................................................................................

2. ජයග්‍රාහී කණ්ඩායම අයත් දිස්ත්‍රික්කය :- .....................................................................................

3. ජයග්‍රාහී කණ්ඩායම අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ..........................................................

4. ජයග්‍රාහී කණ්ඩායම් සාමාජිකයන්ගේ නම් (කණ්ඩායම් නායකයාගේ නම අංක 01ට සඳහන් කරන්න)

| අංකය | නම | දුරකථන අංකය | හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |

2017 දෙටුවර අභිමන් දැනුම මිනුම තරඟාවලියෙන් ............................................... පළාතෙන් ලකුණු ............. ලබාගෙන ............................................ දිස්ත්‍රික්කයේ ......................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැකුළු සමාජ කණ්ඩායම පළාත් තරඟාවලියෙන් පළමු ස්ථානය ලබාගෙන ජයග්‍රහණය කොට අවසාන මහා තරඟයට තේරී ඇති බව අනුමත කරමි.

.........................................

දිනය

.........................................................

පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ